# සංහතික මාධ්‍ය අභිසාරීතා ක්‍රියාවලිය සමකාලීන පුවත්පත් මාධ්‍යවේදය කෙරෙහි සිදුකරනු ලබන බලපෑම

ආචාර්ය ටියුඩර් වීරසිංහ

වර්තමානයේ ක්‍රියාත්මක වන සංහතික මාධ්‍ය පද්ධතිය මානව වර්ගයාගේ ඉතිහාසය තුළ එක්වරම එකම ආකාරයට බිහි වූවා නොවේ. එය මානව වර්ගයාගේ සමාජ පරිණාමයෙන් නිශ්චිත සංවර්ධන මට්ටමක දී බිහිවී විකාශනය වී අද්‍යතන තත්ත්වය දක්වා වර්ධනය වී ඇත. මානව ඉතිහාසයේ වර්ධනය වූ මුල්ම සංහතික තොරතුරු සම්ප්‍රේෂණ ස්වරූපය වූයේ ලිඛිත මාධ්‍යය පාදක කර ගත් පුවත්පත් සහ සඟරාය. මුල්ම පුවත්පත් සහ සඟරා බිහිවීම 16 හා 17 වන සියවස් අතර සිදුවන අතර, ඒවා ජර්මනිය, බ්‍රිතාන්‍ය, ප්‍රංශය ආදී බටහිර යුරෝපීය රටවල් කේන්ද්‍ර කොට ගෙන බිහි වී වර්ධනය වූ බව ප්‍රකටය.

සංහතික මාධ්‍යයන්ගේ ඓතිහාසික වර්ධනය දෙස බලනවිට අපට පෙනී යන මූලික කරුණක් වන්නේ එය එක් අතකින් සමාජ, ආර්ථික, විද්‍යාත්මක, තාක්ෂණික කොන්දේසි මත තත්ත්වාරෝපණය වෙමින් එම ක්ෂේත්‍රවල විශේෂතා ප්‍රකට කරමින් සංවර්ධනය වූ අතර, අනෙක් අතින් ඒ ඒ සංහතික මාධ්‍යයන්ගේ වර්ධනයේ අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ විශේෂතාවල අන්තර් ක්‍රියාකාරිත්වය ඔස්සේද වර්ධනය වූ බවය. මේ අනුව සමස්තයක් වශයෙන් සංහතික මාධ්‍ය පද්ධතියේ සංවර්ධනය කෙරෙහි එක් අතකින් එහි අභ්‍යන්තර සාධක, ගතික හා ප්‍රවණතා ද අනෙක්

අතින් සංහතික මාධ්‍යයට බාහිර කොන්දේසි, ප්‍රවණතා හා ගතිකවල බලපෑම ද තීරණාත්මක වන්නේය.

මානව වර්ගයා පූර්ව සමාජවල සිට සමාජ අවධියට අවතීර්ණවීම, ජාතික රාජ්‍ය බිහිවීම, ඒවා අතර සම්බන්ධතා වර්ධනය වීම ලෝක වෙළඳපොළ හැඩ ගැසීම, ආදී කොන්දේසි සංහතික මාධ්‍යයේ ස්වරූපයක් වශයෙන් මුද්‍රිත මාධ්‍ය බිහිවීම සහ එය වර්ධනය වීමට තුඩු දුන් අතර ධනේශ්වර පන්තියේ බිහිවීම සහ වර්ධනය දේශපාලන බල සඳහා වූ ඔවුන්ගේ අරගලය උත්සන්න වීම ආදී කාරණා හේතු කොටගෙන පුවත්පත්වල සහ සඟරාවල අවශ්‍යතාව ඉස්මතු කළේය. එය රාජ්‍ය සහ සමාජය පාලනය කිරීමේ දේශපාලන අවශ්‍යතාව ද, එය සමාජයේ මානසිකත්ව ක්ෂේත්‍රය සංවිධානය කිරීමේ දෘෂ්ටිවාදී අවශ්‍යතාව ද එය ද්‍රව්‍යමය වටිනාකම් නිෂ්පාදනයේ බෙදාහැරීමේ හා පරිභෝජනයේ ආර්ථික අවශ්‍යතාව ද තුළින් උත්කර්ෂණීය කළේය. මේ අනුව වාර ප්‍රකාශන මාධ්‍යයේ ස්වභාවය මෙන්ම එහි වර්ධනය පෙන්නුම් කරන්නේ ඒ ඒ නිශ්චිත සමාජ ඓතිහාසික යුගවල දී සමාජයේ ආධිපත්‍ය දරන සමාජ බලවේගවල දෘෂ්ටිවාදය, චින්තනය, අදහස් ගෙන හැර දක්වීමය. එය සිදුවන්නේ සංවිධානාත්මක සමාජ ආයතනයක් වශයෙනි. මේ අනුව පුවත්පත්, සඟරා ආදී වාර ප්‍රකාශන යනු මානව සමාජයේ නිශ්චිත සංවර්ධන මට්ටමකදී බිහිවන්නා වූද නිශ්චිත සමාජ බලවේගවල අවශ්‍යතා හා උවමනාවන් නියෝජනය කරන්නා වූද, සමාජ ආයතනයක් ලෙස සංවිධානාත්මක සමාජය තුළ දෛනිකව සිදුවන සංහතිකයින්ගේ විශේෂයෙන්ම පාලක ස්තරවල අවශ්‍යතා හා උවමනාවන් ස්පර්ශ කරන්නා වූද සිදුවීම් ආධිපත්‍යවාදී දෘෂ්ටිවාදී රාමුව තුළ අර්ථකථනය කරමින් අදාළ සමාජ යථාර්ථයන්ට සංහතිකයින්ගේ දෘෂ්ටිවාදී සම්බන්ධතාව හැඩගස්වන්නා වූද සංකීර්ණ සමාජ දේශපාලන ආයතනයකි.

මානව සංහතියේ ඉතිහාසයේ පුවත්පත් සහ සඟරා බිහිවීමට බලපාන ලද මූලික හේතුව වූයේ ආර්ථික තොරතුරුවල අවශ්‍යතා බව අවධාරණය කළ යුතුය. එසේම ඊට සමාන්තරව රාජ්‍ය හා පාලන ක්ෂේත්‍රය සම්බන්ධ තොරතුරුවල වැදගත්කමද අවධාරණය කළ යුතුය. එම ආර්ථික අවශ්‍යතා ඉටුකිරීමේ අවශ්‍යතාව ඊට අදාළ මාධ්‍යයන්ගේ බිහිවීම සහ වර්ධනය අපේක්ෂා කළේය. එහි



ප්‍රතිඵලය වූයේ පුවත්පත් සහ සඟරා ආදී වාරප්‍රකාශන මානව විඥානයේ නවත් නව මාධ්‍යයක් ලෙස ආරම්භයේ සිටම සිය සංහතික ස්වරූපය ද ප්‍රකට කරමින් එහි වර්ධනය ආරම්භ කළේය.

ආර්ථික වශයෙන් නොදියුණු ඌන සංවර්ධිත රටක පුවත්පත් හා සඟරා ඇතිවීමට හැකියාවක් නොමැති අතර ඒවා පිළිබඳව කිසිවකුට හෝ අවශ්‍යතාවක් ද ඇතිවන්නේ නොවේ. විශේෂයෙන්ම වෙළඳ පොළ සහ ප්‍රජාමූල සම්බන්ධතා වර්ධනය වත්ම පුවත්පත්වලට සහ සඟරාවලට ඇති අවශ්‍යතාව, ඉල්ලුම, වර්ධනය වන බව පෙනේ. සමාජ, ආර්ථික, දේශපාලන දෘෂ්ටිවාදී, වෙළඳපොළ, පාරිභෝගික සම්බන්ධතා වර්ධනය වීම තුළ පුවත්පත, සඟරාව භාණ්ඩයක් බවට පරිවර්තනය වූ අතර, ඉන් අනතුරුව එය පොදු ධනේශ්වර නිෂ්පාදන ක්‍රියාවලියට ආවේණික නියමයන්ට අනුකූලව වර්ධනය වන්නට විය.

මුල්ම පුවත්පත් සහ සඟරා විශාල කාල පරාසයක් තුළ නිකුත් වන්නට වූ අතර, සමහර විට එහි අද මෙන් නිශ්චිත නිතිකාලික රටාවක් දැකිය හැකි නොවූවත්, ඒවා පසුව වාර්ෂිකය, ත්‍රෛමාසිකය ආදී වශයෙන් සඟරා පළවන්නට වූ අතර පුවත්පත් මාසිකය, දෙසතිකය. සතියක අවසානයේ පුවත්පත්වල නිතිකාලිකතාව දිනපතා දක්වා වර්ධනය වූ බව පෙනේ. මෙයට විශේෂයෙන්ම ඉවහල් වූයේ විද්‍යාත්මක, තාක්ෂණික දියුණුවත්, වෙළඳපොළ යාන්ත්‍රණයන් වර්ධනය වීමත් මිනිස් සමාජ, ආර්ථික, සංස්කෘතික දෘෂ්ටිවාදී අවශ්‍යතා සංකීර්ණවීමත්ය. අවසානයේ දී පුවත්පත සිය ඓතිහාසික පරිණාමය තුළ මිනිස් පැවැත්මේ දෛනිකත්ව මානසිකත්වය, විඥානය පරාවර්තනය කරන ස්වරූපයක් බවට පත්විය.

පුවත්පත සිය ඓතිහාසික පරිණාමය තුළ අදාළ යුගයේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වමින් වඩාත් ගතික, ජංගමශීලී සංහතික මාධ්‍ය ස්වරූපයක් කරා වර්ධනය වූයේ සිය ආවේණික ලක්ෂණ ද වෙනස් වන තත්ත්වයන්ට අනුකූල වන පරිදි වෙනස්කර ගනිමින්ය. පුවත්පත සම්බන්ධ එම ඓතිහාසික වශයෙන් වර්ධනය වූ ගතිකත්වය එහි නිෂ්පාදනයේ තාක්ෂණික තත්ත්වයන්ට, බෙදාහැරීමේ වෙළඳපොළ යාන්ත්‍රණයට පමණක් සීමා වූයේ නැත.

එය පුවත්පතේ ආකෘතිමය, නිර්මාණාත්මක සහ අන්තර්ගතමය පැතිකඩවලට ද අදාළ වූ බව අවධාරණය කළ යුතුය. එසේම සංහතික පාඨක ග්‍රාහකත්වයේ ද එම ගතිකත්වය නිරීක්ෂණය කළ හැකිය.

අප ඉහත ගෙන හැර දක්වන ලද ධනේශ්වර වෙළඳපොළ සම්බන්ධතා ව්‍යාප්තවීම හා ප්‍රාග්ධනයේ සංකේන්ද්‍රණය එම පුවත්පත් හා සඟරා ආදී වාරික ප්‍රකාශන බිහිවීම සහ වර්ධනය වීමට ප්‍රමාණවත් නොවූ අතර ඒ සඳහා විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය ද සුවිශාල දායකත්වයක් සැපයීය. මෙය ඇත්ත වශයෙන්ම සමකාලීන මානව සමාජයේ සංහතික මාධ්‍යයන්ගේ වර්ධනයට පමණක් නොව පොදුවේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ තීරණාත්මක කොන්දේසියකි.

විශේෂයෙන් 14 සියවස අවසානයේ දී ජර්මනිය වඩාත්ම ලාභ අමුද්‍රව්‍යවලින් කඩදාසිවලින් මහ පරිමාණිකව නිෂ්පාදනය කිරීමේ යාන්ත්‍රික ක්‍රමය සොයා ගැනීම පුවත්පත්වල ප්‍රචාරණය, සංරක්ෂණය (පිටපත් සංඛ්‍යාව) යථාර්ථයක් වූ බවට පත් වූ අතර ඊට නියම සංහතික ස්වරූපය අත්පත් කර ගැනීමට හැකිවිය. 15වන සියවස මැද භාගයේදී චලන මුද්‍රණ යන්ත්‍රය නිර්මාණය කිරීමත් සමඟ ආරම්භ වන "ගුටෙන්බර්ග් යුගය" පසුගිය සියවසේ අවසානය දක්වා මුද්‍රණ ලෝකයේ සුවිශාල භූමිකාවක් ඉටු කරන ලදි. මෙය 15 වන සියවසේ පොදු ප්‍රකාශනයේ ආරම්භය සනිටුහන් කළ අතර වෙළඳපොළේ සහ සංස්කෘතියේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වන වර්ධනයක් මුද්‍රණ කර්මාන්තයට ලබා ගැනීම සඳහා තවත් සියවසකට අධික කාලයක් ගතවිය.

මේ අනුව 17 වන සිය වස තුළදී පුළුල් ලෙස වර්ධනය වන පුවත්පත් 20 වන සිය වස අවසානය තෙක් ස්වාධීන සහ ස්වයංප්‍රාමාණික මාධ්‍යයක් වශයෙන් එය අනන්‍යතාව රැක ගනු ලැබුවේ ගුවන් විදුලිය සහ රූපවාහිනියද සමඟ පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වීම තුළ බව විශේෂයෙන් පෙන්වා දිය යුතුය. එනම් පුවත්පත් පැවැති කාලය තුළ ගුවන් විදුලිය සහ රූපවාහිනිය බිහි වුවද ඒවායේ බලපෑම පුවත්පතේ සැලකිය යුතු වෙනස් කම් ඇති කිරීමට සමත් නොවීය. 20 වන සියවස අවසානයේදී සහ 21 වන



සියවස ආරම්භයේදී විද්‍යා තාක්ෂණික ක්ෂේත්‍රයේ, විශේෂයෙන් සන්නිවේදන හා සංහතික මාධ්‍ය තාක්ෂණික සහ තාක්ෂණවේදී ක්ෂේත්‍රයේදී සිදු වූ සහ දැනටමත් සිදු වෙමින් පවතින වෙනස්කම් සමකාලීන පුවත්පතේ ඓතිහාසික මුහුණුවර, ව්‍යුහය, ආකෘතිය, පමණක් නොව එහි අන්තර්ගතය පවා විපර්යාසයට ලක් කිරීමේ සම්පූර්ණ හැකියාවක් ප්‍රදර්ශනය කරමින් සිටින්නේය.

වර්තමානයේ අප ජීවත්වන්නේ සමස්ත සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතියට මූලමය වශයෙන් විපරිවර්තනයන්ට ලක්වන යුගයකය. විවිධ මාධ්‍යයන් අතර ඒකාග්‍රතා, අනුකලන ක්‍රියාවලින් වර්ධනය වෙමින් සංහතික මාධ්‍ය තුළ ආභිසාරීතා ප්‍රවණතා ඉතිහාසයේ ඇති අන් කිසිම දාක නොවූ විරූ ආකාරයට වර්ධනය වන මොහොතකය.

විශේෂයෙන්ම සංහතික මාධ්‍ය තාක්ෂණය සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ අභිසාරීතා ප්‍රවණතා වර්ධනය වන්නට වූයේ පරිගනක තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කර ගෙනය. සංහතික මාධ්‍ය පද්ධතිවල ව්‍යුහය සහ ආකෘතික වෙනස්කම් සිදුවන්නට වූ අතර සංහතික මාධ්‍ය පද්ධතිවල ශ්‍රව්‍ය-දෘශ්‍ය ස්වරූපයේ තොරතුරු සංඛ්‍යාත ස්වරූපයට පරිවර්තනය ආරම්භ විය. මෙම අභිසාරීත සංකල්පය මුලින්ම සන්නිවේදන තාක්ෂණික ක්ෂේත්‍රය තුළ භාවිතයට ගන්නා ලද්දේ "නිදහසේ තාක්ෂණය" (The Technologied of Freedom) නම් කෘතියේ එතිල් ද සෝලා පුල් ය. අනාගතයේදී සියලුම තොරතුරු සංඛ්‍යාංත ස්වරූපයෙන් පමණක් සම්ප්‍රේක්ෂණය හා සංරක්ෂණය වන බව ඔහු පෙන්වා දුන්නේය. (Sola Pool 1983, 344) වර්තමාන පුවත්පත් මාධ්‍යයේ සහ රූපවාහිනී මාධ්‍යයේ මෙම සන්නිවේදන තාක්ෂණික ක්ෂේත්‍රයේ සිදුවන ඒකලව්වනල රාශිකරණ ක්‍රියාවලිය නිසා එම අන්‍යෝන්‍ය වශයෙන් සම්පවීමේ .ප්‍රවණතාව උත්සන්න වෙමින් පවතී. තාක්ෂණික වර්ධනය සියලු සංහතික සන්නිවේදන මාධ්‍යයන් ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධ කරන බව අවධාරණය කෙරේ. (Glaberson,w 1994,1) වසර කීපයකට පසු මෙය සිදු වූ අතර බොහෝ වෙබ් අඩවිවල මුද්‍රිත මාධ්‍ය පුවත්පත් ලිඛිත පඨිත ස්වරූපයෙන් පමණක් නොව ඡායාරූප, රූපදර්ශන-ශ්‍රව්‍ය කොටස් ද ඇතුලත්ව ප්‍රචලිත වන්නට විය. වර්තමානයේ මුද්‍රිත මාධ්‍ය

පුවත්පත් කාර්යාල බහු මාධ්‍ය ප්‍රවෘත්ති මැදිරි බවට පරිවර්තනය වෙමින් පවතින්නේය. වර්තමානයේ පුවත්පත් සඟරාවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඒවායේ අන්තර්ගතය බහුලීකරණය, ව්‍යාප්ත කිරීම සහ සම්ප්‍රේක්ෂණය කිරීම සඳහා අලුත් මාධ්‍ය වේදිකාවන් සෙවීමයි. මේ සඳහා රූපවාහිනී තිරය, අන්තර්ජාලය, ජංගම දුරකථන ප්‍රයෝජනයට ගන්නා බව පෙනේ. නමුත් මෙහි දී වැදගත් වන්නේ පුවත්පත් හා සඟරා සිය අන්තර්ගතය ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය භාවිතා කරමින් සම්ප්‍රේක්ෂණය කිරීම නොව, පුවත්පත සහ සඟරාව ශතවර්ෂ හතරකට වැඩි කාලයක් පවත්වාගෙන ආ සිය අනන්‍යතාව ව්‍යුහාත්මක ලෙස වෙනස් වීමකට භාවිත වීමයි. එක් අතකින් පුවත්පත් සඟරාව පිටු වැඩි වැඩියෙන් දෘශ්‍යකරණයට ඡායාරූපීකරණයට ආලේඛනකරණයට, ප්‍රාසරතාරිකරණයට, රූපදර්ශිකරණයට, ලක්වීම සහ අනෙක් අතින් රූපවාහිනී මාධ්‍ය තිරය වැඩි වැඩියෙන් ලිඛිත පඨිතකරණයට, ශීර්ෂ පාඨකරණයට, ලක්වීම සමකාලීන සංහතික මාධ්‍ය ක්ෂේත්‍රයේ පොදු ප්‍රවර්ධනතාවක් බවට පත්වී අවසානය.

මේ තත්ත්වය තුළ සංහතික මාධ්‍යකරුවාගේ ඓතිහාසික භූමිකාව ද වෙනස් වන්නේය. අර්ථවත්වූ සාමාන්‍ය ලේඛන කුසලතාව දුන් ප්‍රමාණවත් නොවන අතර, සිය පුවත්පත් සන්දේශය චිත්‍ර, ආලේඛන, ඡායාරූප රූපදර්ශන ආදියෙන් යුතුව ආකර්ෂණීයව සකස්කළ යුතු වන්නේය. පිටුව තුළ ලිඛිත තොරතුරුවලට වඩා දෘශ්‍ය තොරතුරු වැඩිවිය යුතුය. දුන් පැහැදිලිව පෙනෙන ආකාරයට පුවත්පත් පාඨකයා අල්පීකරණය වෙමින් එහි දෘශ්‍යනය වර්ධනය වන්නේය. මෙය ඇත්ත වශයෙන්ම වර්තමාන සංහතික සංස්කෘතියේ පාඨක පැතිකඩ අවමවීම සහ එහි දෘශ්‍යනය පැතිකඩ ප්‍රසාරණයවීමේ ප්‍රතිඵලයකි. මෙය වර්තමාන පුවත්පත් සහ සඟරාවල පිටු අතරින් දැකිය හැකි ලක්ෂණයකි.

වර්තමානයේ දී සිදුවෙමින් පවතින තාක්ෂණික අභිසාරිතා ක්‍රියාවලියට සමාන්තරව මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලියක් ද සිදු වන්නේය. සමකාලීන සංහතික මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලිය තුළ පුවත්පත්වල සඟරාවල සිදුවන වෙනස්කම් සුවිශාල වැදගත් කමක් දරන්නේය. මේ තත්ත්වය තුළ සමකාලීන සංහතිය මාධ්‍ය



ප්‍රවෘත්තිකරණ ක්‍රියාවලිය සංකීර්ණ වනවා පමණක් නොව එහි විවිධ ස්වරූප ද වර්ධනය වීමක් සනිටුහන් කරන බව පැහැදිලිය. අභිසාරිතා ප්‍රවෘත්තිකරණය, අන්තර්මාධ්‍ය ප්‍රවෘත්තිකරණය නිදර්ශන ලෙස ගෙන හැර දැක්විය හැක. මෙම සහතික ප්‍රවෘත්ති කරණ ස්වරූප අතර ප්‍රකට වන විශේෂතා වෙනස් කම් සහ ඒවා සමාජනයක් ලෙස සංහතික මාධ්‍ය ක්‍රියාවලියට බලපාන ආකාරය ආදිය පිළිබඳව අධ්‍යාපනය කිරීම අනාගත මාධ්‍ය අධ්‍යයනයේ කර්තව්‍යයකි. (Quinn S 2005256)

ලෝකයේ විවිධ රටවල මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලියේ බල පෑම තුළ පුවත්පත් සහ සඟරා මාධ්‍යයේ සිදුවන වෙනස්කම් අදාළ රටවල එම ක්‍රියාවලියට බලපාන අභ්‍යන්තර සහ බාහිර සාධක රාශියක් මත තීරණය වේ. අන්තර්ජාල පහසුකම් වර්ධනයේ මට්ටම, නෛතික රාමු, අන්තර්ජාල භාවිතා කරන්නන්ගේ ප්‍රමාණය, ජංගම දුරකථන කර්මාන්තයේ වර්ධන මට්ටම, තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය, මාධ්‍ය වෙළඳපොළ විශේෂිත බාහිර සාධක වන අතර නිශ්චිත ප්‍රශ්න සම්බන්ධව නායකයන්ගේ මනෝමූලික සම්බන්ධතාව, සංස්කෘතික සම්ප්‍රදායන් හා මූල්‍ය ගැටලු අභ්‍යන්තර සාධක අතර වේ. නිදර්ශන වශයෙන් බ්‍රිතාන්‍ය පුවත්පත් මාධ්‍ය අභිසාරිතා අවකාශය තුළ වැඩි වැඩියෙන් නව මාධ්‍ය වේදිකා භාවිතයට ගන්නා බව පෙනේ. ජංගම දුරකථන, (Pad), විද්‍යුත් පුවත්පත (E-Paper) ඒ අතර බහුලව දක්නට ලැබේ. (Fisher D,Gr ont A, Wilkinson g 2008, 240). බ්‍රිතාන්‍ය බොහෝ ප්‍රකාශන විශේෂ අවධානය යොමු කරන්නේ සිය මුද්‍රිත මාධ්‍ය බහුලීකරණ වේදිකාවල වැඩි වැඩියෙන් ශ්‍රව්‍ය-දෘශ්‍ය අන්තර්ගත යොදා ගැනීමටය. ස්පාඤ්ඤයේ පුවත්පත් ආයතන වර්ධනය වන්නාවූ අභිසාරිතා ක්‍රියාවලිය තුළ සිය පුවත්පත් වල අන්තර්ගතය ව්‍යාප්ත කරලීම සඳහා සියලුම මාධ්‍ය වේදිකා භාවිතයට ගන්නා බව පෙනේ. වේගයෙන් වර්ධනය වන්නා වූ මාධ්‍ය අභිසාරිතා කොන්දේසි යටතේ ඇමෙරිකානු පුවත්පත් සහ පුවත්පත් ආයතන පුවත්පත්, රූපවාහිනී නාලිකා සහ වෙබ්-අඩවි යන මාධ්‍ය වේදිකා ත්‍රිත්වය ප්‍රයෝජනයට ගනී. මේ සියල්ලටම වෙනස්ව මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලිය ඉතා වේගයෙන් ව්‍යාප්තව සංවර්ධනය වන ආසියානු කලාපයේ පුවත්පත් සහ පුවත්පත් කාර්යාල සිය

මුද්‍රිත මාධ්‍ය සන්දේශ බහුලීකරණය සඳහා වැඩියෙන්ම භාවිතයට ගනු ලබන්නේ ජංගම දුරකථන බව සඳහන් කළ යුතුය. ඇත්ත වශයෙන්ම මාධ්‍ය සන්දේශ ව්‍යාප්තකරලීම සඳහා පමණක් නොව සංහතික මාධ්‍ය සන්දේශ නිෂ්පාදන ක්‍රියාවලියේදී ද ආසියානු කලාපයේ ජංගම දුරකථන භාවිතා කරන්නන්ගේ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. (Quinn S 2008,170) මේ නිසා ක්‍රමානුකූලව පුවත්පත් කාර්යාල තුළ ප්‍රවෘත්ති අංශවල භූමිකාව තීරණාත්මක වන්නේය. විශේෂයෙන්ම නව මාධ්‍යයක් වශයෙන් ජංගම දුරකථන සම්බන්ධතා වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස පුරුසි ප්‍රවෘත්තිකාරකයන්ගේ සක්‍රිය දායකත්වය එන්න එන්නම වර්ධනය වන බව පෙනේ. මෙය සත්‍ය වශයෙන්ම සාම්ප්‍රදායික පුවත්පතේ මුහුණුවර පමණක් නොව එහි සාම්ප්‍රදායික අන්තර්ගතයේ සහ ආකෘතියේ වෙනස්කම් ඇති කරලීමට සමත් ව තිබේ. ශ්‍රී ලාංකේය පුවත්පත්වල ද මේ මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලියේ බලපෑම පාදක කොට ගෙන ප්‍රකාශයට පත් වන පුවත්පත්වල සාම්ප්‍රදායික අන්තර්ගතය සහ ආකෘතිය විපරිමර්නනයට ලක්වෙමින් පවතින බව පෙනේ. දැනටමත් බොහෝ පුවත්පත් අන්තර්ජාල කොට ඇති අතර එහි ප්‍රතිඵලයන් වශයෙන් පුවත්පත්වල අන්තර්ගතය සකස්කරන ආකාරය සහ එහි ආකෘතිය අන්තර්ජාලීකරණය වෙමින් පවතී. විශේෂයෙන් සම්ප්‍රදායික වශයෙන් පුවත්පත්වල ආධිපත්‍ය දරන ලද එහි ලිඛිත පඨිතවල ප්‍රමාණය අඩුවෙමින් ඒ වෙනුවට පුවත්පත් පිටුවල විශාල අවකාශ දෘශ්‍යකරණයට ලක්වෙමින් පවතී. විශේෂයෙන් පුවත්පතේ ආකෘතික රූපදර්ශනකරණයවීම පමණක් නොව එහි අන්තර්ගතය ද ගම්‍ය කිරීමට සමත්වන ආකාරයේ විවිධ ඡායාරූප ආලේඛන විධි, කාටූන, දෘශ්‍ය සංකේත එසේම මුද්‍රිත අක්ෂර පාඨක ස්වරූපය අතික්‍රමණය කර දෘශ්‍ය අභිනතියක් ප්‍රදර්ශනය කරවීමට හැකිවන ආකාරයට ඉදිරිපත් කෙරේ.

මේ සියල්ල මඟින් අදහස් කරන්නේ සමකාලීන සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලිය තුළ මූල්‍ය ප්‍රවණතාවක් වන පඨිත දෘශ්‍යකරණයවීමේ ප්‍රවණතාව මඟින් සමාජය තුළ දෘශ්‍ය සංස්කෘතීන් නිර්මාණයවී ඇති බවත් වර්තමාන සංහතික මිනිසාගේ ලෝකවයංවානනය තුළ සංහතික දෘශ්‍ය විඥාපන ස්වරූපය ප්‍රමුඛවී ඇති බවත්, අද්‍යතන පුවත්පත්, සඟරා ඇතුළු



මුද්‍රිත මාධ්‍ය එම දෘශ්‍ය සංස්කෘතියේ පොදු නියමානුකූලතාවල බලපෑම ඔස්සේ වර්ධනය වන බවත්ය.

මෙම සන්නිවේදන සහ සංහතිමාධ්‍ය ක්ෂේත්‍රයේ සිදුවන අභිසාරිතා ක්‍රියාවලිය සංහතික මාධ්‍යවේදය, සංහතික මාධ්‍ය වෘත්තිකභාවය, සංහතික මාධ්‍ය චින්තනය විශ්වීයකරණයට ආවශ්‍යධිත පදනම නිර්මාණය කරමින් සිටින්නේය. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුවන්නේ මේ නව තත්ත්වයන්ට සහ යථාර්ථයන්ට ගැළපෙන ආකාරයට සන්නිවේදන සහ සංහතික මාධ්‍ය අධ්‍යයනය සහ අධ්‍යාපනයද වෙනස්විය යුතු බවය. (Marinho S, Trcia,L. 2008,29) සංහතික සන්නිවේදන සහ සංහතික මාධ්‍ය ක්‍රියාවලිය පමණක් නොව අන්තර් පුද්ගල සන්නිවේදන ක්ෂේත්‍රයද ශීඝ්‍ර ලෙස සහ පුළුල් ලෙස මාධ්‍ය අභිනාසාරීකරණයට ලක්වීම ඊට ගැළපෙන මාධ්‍ය අභිසාරිතාත්මක චින්තනයක් හා කුසලතා වර්ධනය අපේක්ෂා කෙරේ.

මේ නව තත්ත්වයන් යටතේ වර්තමාන ප්‍රවෘත්තිකාරයකු සතු විය යුතු මූලික ශක්‍යතා, හැකියාවන්, කුසලතා, නිපුණතා, රාශියක් දැක්විය හැකිය. අධ්‍යතන ප්‍රවෘත්තිකරණ ක්‍රියාවලිය තුළ නිරන්තරව සිදුවන වෙනස්කම් වර්තමාන තත්ත්ව සම්බන්ධව සවිඥානික විය යුතු අතර තොරතුරු සෙවීම, ඒකරාශීකිරීම, සකස්කිරීම නවීන තොරතුරු තාක්ෂණික සහ තාක්ෂණිකවේදී නවීන ක්‍රම භාවිතා කරමින් කිරීමේ හැකියාව වර්ධනය කරගත යුතුය. නවීන සංහතික පුවත්පත් මාධ්‍යවේදියා, හෝ පොදුවේ සංහතික ප්‍රවෘත්තිකාරක විවිධ වූ මාධ්‍ය වේදිකා සඳහා යෝග්‍ය වන්නාවූ සන්නිවේදන නිර්මාණය කිරීමේ කුසලතාව හිමිකරගත යුතුය. ඔහු හෝ ඇය මූලික වශයෙන් ඡායාරූප ප්‍රවෘත්තිවේදය, රූපදර්ශන ඡායාරූපකරණයේ, දැනුම හා හැකියාව සමග එක් යම්කිසි නිශ්චිත ක්ෂේත්‍රයක විශේෂිකරණය වීම අධ්‍යතන අවශ්‍යතාවකි. සමකාලීන පුවත්පත් මාධ්‍ය ප්‍රවෘත්තිකාරකයකු සිය සන්දේශය අන්තර්ජාලයට සරිලන පරිදි නවීකරණය කිරීමේ සහ අදාළ පඨිතය අන්තර්ජාල ශක්‍යතාවලට අනුකූලවන පරිදි තක්සේරු කිරීමට හැකිවිය යුතුය.

සමකාලීන මාධ්‍ය සැලසුම්කරුවකු ඉහළ දෘශ්‍ය සංස්කෘතියක ගුණාංගවලින් පිරි පුද්ගලයකු විය යුතුය. විශේෂයෙන් වර්තමාන පුවත්පතේ සැලැසුම්කරු සංහතික පාඨක විශේෂතා සහ වෙළඳපොළ ගතික හා ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් පුවත්පතේ උපයෝගිතා දෘෂ්ටිවාදී සෞන්දර්යාත්මක විනෝදයක කාර්ය පද්ධතියේ දෘෂ්ටිකෝණයට අනුව නිමාකළ යුතුය. මෙම සමකාලීන පුවත්පත් සංරචකයේ ක්‍රියාකාරිත්වයේ අතිශය වැදගත් පැතිකඩකි. මෙහි දී පුවත්පතේ සංරචනය යනු නිර්මාණාත්මක ක්‍රියාවලියකි. එමගින් පුවත්පතට සුවිශේෂාකාරයේ ප්‍රාණවත්භාවයක් සහ සිය අනන්‍යතාව ආරක්ෂාවෙමින් සැමවිට නිත්‍ය නැවුම් හා ප්‍රබෝධවත් භාවයක් ලැබෙන්නේය. එය සංහතික පාඨක විඥානයේ නිලීන මූලික සමාජ මනෝවිද්‍යාත්මක, සංවේද්‍ය-මනෝභාවිත ගතිකයන් උත්කර්ෂණයට සහ ප්‍රබෝධනයට ඉවහල් වන්නේය. මේ සාධක වලට අනුකූලව වර්තමාන පුවත්පත් සැලසුම්කරු සිය කටයුතු කිරීමේදී සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතියේ මුඛ්‍ය ප්‍රවණතාව වන දෘශ්‍යකරණය සහ රූපදර්ශනකරණය කෙරෙහි අවධානය යොමුකිරීම අත්‍යවශ්‍ය කොන්දේසියකි.

අද්‍යතන සංහතික මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලිය තුළ පුවත්පත් මාධ්‍ය සැලසුම්කරුවකු එය පුවත්පතේ සංරචනාත්ම පැතිකඩ ගොඩනැඟීමේදී ආලේඛනවේද ය ආලේඛන කලාව අතිශය වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ සාම්ප්‍රදායික පුවත්පත ඊට දුන් ස්ථානය කෙරෙහි  පමණක් අවධානය යොමුකර නොවන අතර, අද්‍යතන සංහතික මාධ්‍ය අභිසාරිකරණය තුළ එහි දෘශ්‍ය සහ රූප දර්ශනයේ භූමිකාව අද අන් කවරදාටත් වඩා ඉදිරියට පැමිණ ඇති බැවිනි.

විශේෂයෙන් වර්තමාන පුවත්පත් සංරචන ක්‍රියාවලියේදී අවශ්‍යයික පරිපූර්ණත්වය, අභින්නතාව ලැබෙන්නේ විවිධ වූ ආලේඛන කලාත්මක සංඝටනයන්ගේ සංකීර්ණ සමස්තය තුළිනි. සමකාලීන පුවත්පත්වල සංරචනය බහුතලමය බහුමානමය ස්වරූපයක් ගන්නා බැවින් සංරචන සංකල්පයේ පරමාදර්ශීක භාවය යම් කිසි වියුක්ත භාවයක් ද ගෙන දෙන්නේය. ඕනෑම ආලේඛන කලා නිර්මාණයකට ආවේණික ද්වීත්ව ස්වභාවය වන එහි සංයුක්ත සාක්‍ෂ්‍යතාව සහ වියුක්ත සාක්‍ෂ්‍යතාව පුවත්පත්



ආලේඛනයට ද එක සේම අදාළ වන බව අවධාරණය කළ යුතුය. පුවත්පතේ සංරචනය ස්මිතික විය හැකි අතරම මෙම දෙකේ සංයෝගයක් ද විය හැකිය. බොහෝ පුවත්පත් තමන්ට ආවේණික වූ නිශ්චිත සංරචනාත්මක ක්‍රමයක් අනුගමනය කරමින් සිය පුවත්පතේ අනන්‍යතාව සහ ප්‍රතිරූපය පවත්වාගෙන යන බව ප්‍රකටය.

වර්තමාන මාධ්‍ය අභිසාරීකරණ ක්‍රියාවලිය තුළ පුවත්පත් මාධ්‍යයේ ශෛලීය විශේෂතා ද සමකාලීන මාධ්‍ය අවකාශයේ මාධ්‍ය පැතිකඩ වන දෘශ්‍ය සහ රූපදර්ශන මාදිලියට අනුකූලව සකස්වෙමින් පවතින බව නිරීක්ෂණය වේ. පුවත්පතක ශෛලීය යනු එහි අන්තර්ගත හා ආකෘතික පැතිකඩ සම්බන්ධ වන්නාවූ සංකීර්ණ ප්‍රපංචයකි. පුවත්පතේ සැලසුමට අදාළව එහි ශෛලීය මට්ටම් කීපයකින් සලකා බැලිය යුතු වන්නේය. අද්‍දාළ පුවත්පතේ විශේෂතා වන්නේ සාමස්තිකභාවයේ විශේෂතා මෙන් ම අදාළ පුවත්පතේ ගතිලක්ෂණයන්ගේ මුහුණුවරේ ඒකියත්වය ඒ අතර ඉතා වැදගත් වන්නේය.

මෙම කරුණු කෙරෙහි අපගේ අවධානය ගැඹුරින් යොමු කිරීමේදී පෙනී යන්නේ වර්තමාන සන්නිවේදන සහ සංහතික මාධ්‍ය තාක්ෂණයේ හා තාක්ෂණවේදයේ සිදුවෙමින් පවතින ගෝලීය පරිමාණයේ අභිසාරිකරණ ක්‍රියාවලිය සමකාලීන පුවත්පතේ සමස්ත  ව්‍යුහය සහ මුහුණුවර වෙනස් කිරීම කෙරෙහි තීරණාත්මකව බලපාන බවයි. දූන් ලෝක පුවත්පත් පසු වන්නේ සිය පරිණාම ඉතිහාසයේ සියවස් හතරක කාලසීමාව තුළ මුහුණදුන් සියලුම තත්ත්වයන්ට සහ අභියෝගවලට වඩා අතිශය තීරණාත්මක සන්ධිස්ථානයකය.

මෙය පුවත්පතට අදාළ වන්නේ එහි පරිණාමයේ බාහිර, තාක්ෂණික, ශිල්පීය පැතිකඩ සඳහා පමණක් නොවේ. එය ඓතිහාසික ලෙස හැඩගැසුණ පුවත්පත් අන්තර්ගතයට ද ප්‍රබලව බලපාන්නේය. පුවත්පතේ පරිණාමයේ ප්‍රාරම්භක ඓතිහාසික අවස්ථාවලදී එහි අන්තර්ගතය අතිශය වැදගත් වූ සමාජ නවීකාරක, සංස්කෘතික විපරිවර්තක, මානව ඥානන ප්‍රවණතාවක් සහ මෙහෙවරක් වෙත යොමු වී තිබූ අතර නමුත් සමකාලීන

පුවත්පතේ එහි අන්තර්ගතය අබිබවා ආකෘතිය වැදගත් වී ඇති අතර, එය මානව සහ සමාජ සම්බන්ධතා නිර්මානුෂිකරණය අත්‍යාක්‍රාමණය හා නිර්සමාජයීයකරණය කිරීමේ පරාමිතීන් ඔස්සේ සිද්ධි වාර්තා කිරීමේ යෙදී සිටී. මේ තත්ත්වය තුළ වර්තමාන පුවත්පත්වල අන්තර්ගත තොරතුරු අධිසංවේදී වූද, උද්යෝග කර වූද, ගුප්ත වූද, සන්දෘෂ්ටිකවාදී වූද, භාවික වූද, සමාජ මානසික පරිගණයක් තුළ ගෙන හැර දැක්වීම අද්‍යතන බොහෝ ශ්‍රී ලාංකේය පුවත්පත්වල කැපී පෙනෙන ලක්ෂණයක් බවට පත්වී ඇත. මෙම ඉහත ආකෘතිය තුළ වර්තමාන බොහෝ පුවත්පත් පිටු තුළින් යථාර්ථය ව්‍යාජිකරණයට දෘෂ්ටිවාදිකරණයට ලක් කරමින් සංහතික විඥානය වෙළඳ හා දේශපාලන ප්‍රාග්ධනයේ අවශ්‍යතාවලට අනුකූලව පවත්වාගෙන යනු ලැබේ. සම්භාව්‍ය අවධියේ පුවත්පත් ප්‍රවෘත්තිකරණය සමාජ දේශපාලන ආර්ථික ගැටලු පිළිබඳ යථාරූපී පින්තූරයකින් විවිධ සමාජ දේශපාලන පන්ති හා බලවේගවල අරගලය ඔස්සේ ඉදිරිපත් වුවද ගෝලීය මට්ටමේ මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලියේ බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් පුවත්පත් ප්‍රවෘත්තිකරණය සමාජ යථාර්ථයට දක්වන සම්බන්ධතාව සහ එය නිරූපණයකරණ මට්ටම හා ස්වරූපය විපර්යාසයට ලක්වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පුවත්පත සමාජ යථාර්ථයට දක්වන සම්බන්ධතාව ශ්‍රවණ-දෘශ්‍යමාධ්‍ය යථාර්ථයට දක්වන ලද සම්බන්ධතාවට සමීප වී ඇත. පෙර දී විවිධ වූ සංහතික මාධ්‍ය යථාර්ථයට දක්වන ලද සම්බන්ධතාව සහ එය පරාවර්තනය කරන ලද මට්ටම හා ස්වරූපය විවිධ මට්ටම් සහ මාධ්‍ය නියෝජනය කළ අතර, නමුත් අද්‍යතන සංහතික මාධ්‍ය අභිසාරිකරණයේ ප්‍රථිඵලයක් වශයෙන් සමාපිත සංහතික මාධ්‍ය මඟින් ඒකරූපිකව, ඒකස්වරූපීයව ඒක මානයව සමාජ යථාර්ථය සහ ජීවිතය නිරූපණය කිරීමේ හැකියාව අත්පත්කරගෙන තිබේ. මේ අනුව සමකාලීන සංහතිකමාධ්‍ය අභිසාරිකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස විවිධ මාධ්‍ය අතර තාක්ෂණික හා තාක්ෂණකවේදී ක්‍රමවේද අතර තිබූ වෙනස්කම් පමණක් නොව, එම මාධ්‍යයන් අතර තිබූ නිර්මාණාත්මක, සංජානනාත්මක, දෘෂ්ටිවාදාත්මක වෙනස්කම් පවා අවම මට්ටමකට පත්කර ඇත.



විශේෂයෙන් මෙහි දී සඳහන් කළ යුත්තක් වන්නේ වර්තමානයේදී මාධ්‍යයේ පැවැත්ම පදනම් වන්නේ ව්‍යාපාරික මාදිලි මතවාද අතර එය සියලුම වර්ගයේ සන්නිවේදන මාර්ග උපයෝගිකරගනිමින්, සංහතිකයින් වෙතට ඕනෑම වෙලාවකදී ඕනෑම ස්ථානයකදී සන්දේශ සමීප කිරීමට හැකියාවක් ඇත. මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලියේ මුඛ්‍ය අදහස් මින් ප්‍රකාශමාන වන අතර,මෙය මුළු ලෝකයේම බොහෝ මාධ්‍ය සමාගම්වල ව්‍යාපාරික උපායමාර්ගයේ මූලික පදනම බවට පත්ව තිබේ. මේ නිසා අනාගත ලෝකයේ පුවත්පතේ ඉරණම එහි සම්භාව්‍ය ස්වරූපයෙන් තීරණය වන්නේ මාධ්‍ය අභිසාරිතා ක්‍රියාවලිය මත පමණක්ම නොව, ව්‍යාපාරික මාදිලින්ගේ ක්‍රියාකාරිත්වය මත බව අවධාරණය කළ යුතුය.

1. De Sola Pool,I,Technologies of Freedom. Cambridge, Belknap Press, Fiest Edition.
2. Glaberson W.The Media Busness,in San Jose, Knight-Ridder Tests a Newspaper Frontier II The New York Time 7, 1994
3. Quin S.(2005) Convergent Journalism, The Fundomentals of Multimedia Reporting. New York Peter Lang,
4. Fidher D, Grant A, Wilkison (2008) Priciples of Convergent Journalism, Oxford University Press
5. Morinho, S, Tarcia L (2008) Challenges and New ways of teaching Journalism in times of media Convert Press